# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2276/59 - 2022 අප්‍රේල් මස 22 වැනි සිකුරාදා - 2022.04.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහිමිවීම හේතුකොටගෙන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ කෙන්ගල්ලේ ගෙදර ධම්මික චන්ද්‍රරත්න අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා කෝනාර මුදියන්සේලාගේ හේරත් බණ්ඩාර මැදගම නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරී, පතිරාජ ආරච්චිලාගේ සුනිල් සේනාරත්න වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් කෝනාර මුදියන්සේලාගේ හේරත් බණ්ඩාර මැදගම, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**පී. ඒ. එස්. සේනාරත්න,**
තේරීම්භාර නිලධාරී,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.

2022 අප්‍රේල් මස 22 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කොළඹ නාගරිකය.

EOG 04-0127

1A - G 36624 — 30 (2022/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ උහන ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහෝසිකිරීම හේතුකොටගෙන උහන ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ උහන ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ රත්නායක මුදියන්සේලාගේ නිමල් බණ්ඩාර අයත් වන්නා වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම උහන ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා දර්ශන නුවන් විජ්ණ දේව නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

උහන ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, අත්තනායක මුදියන්සේලාගේ කසුන් ශ්‍රීනාත් අත්තනායක වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් දර්ශන නුවන් විජ්ණ දේව, උහන ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**කසුන් ශ්‍රීනාත් අත්තනායක,**
තේරීම්භාර නිලධාරී,
උහන ප්‍රාදේශීය සභාව.

2022 අප්‍රේල් මස 22 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අම්පාර

EOG 04-0129

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.